07 ඒකකය - සමාන්තර සරල රේඛා(1)

➢ සමාන්තර සරල රේඛා

එකිනෙක ඡේදනය නොවන සරල රේඛා දෙකකට **සමාන්තර සරල රේඛා දෙකක්** යැයි කියනු ලැබේ.

මේ අනුව p සහ q සරල රේඛා දෙක සමාන්තර වන අතර, l සහ m සරල රේඛා දෙක සමාන්තර නොවේ.

සරල රේඛා කිහිපයක් සමාන්තර බව දැක්වීමට රූපයේ දැක්වෙන ආකාරයට ඊ හිස් එක ම දිශාවට රේඛා මත යොදනු ලැබේ.



- **යම් ලක්ෂ්‍යයක සිට සරල රේඛාවකට ලම්බ දුර**

ක්‍රියාකාරකම 2

(1) සරල රේඛාවක් ඇඳ, එය l ලෙස නම් කර, l මත නොපිහිටි P ලක්ෂ්‍යයක් ලකුණු කරන්න.



(2) රූපයේ දැක්වෙන පරිදි විහිත චතුරස්‍රයේ සෘජු කෝණය සහිත එක් දාරයක් l සරල රේඛාව මත පිහිටන සේත් අනෙක් දාරය P ලක්ෂ්‍යය හරහා යන පරිදිත් විහිත චතුරස්‍රය පිහිටුවන්න.



(3) අනතුරුව l සරල රේඛාව මත A ලක්ෂ්‍යය

Aහි ලකුණු කර ඇති කෝණය, සෘජු කෝණයක් වේ.

AP සරල රේඛා ඛණ්ඩය l සරල රෙඛාවට ලම්බක යැයි කියනු ලැබේ.



➢ **ඔබේ ගණිතය පෙළ පොතෙහි 7.1 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.**